කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය

ජනවාරි 2025

# INFORMATION

මුල් පිටුව පාඨමාලා CTS වෙත ලබා දෙන්න

# දිරි ගැන්වීමේ සේවය සහ සභා වර්ධනයේ දෙවන රැල්ලක්?

"දිරි ගැන්වීම අපව ජීවත් කරවයි, එය නොමැතිව අප සෙමින්, කනගාටුදායක ලෙස, කෝපයෙන් මිය යන්නෙමු" (සෙලෙස්ටි හෝම්)

"දිරි ගැන්වීම ආත්මයට ඔක්සිජන් හා සමානය" (ජෝර්ජ් ඇඩම්ස්)

විදුහල්පතිතුමාගේ පණිවිඩය



අයිවෝ පූබාලන්, PhD
විදුහල්පති

විහිලු සහගත කියමන් සඳහා ප්‍රසිද්ධියක් ඉසිලූ, ඇමෙරිකානු ජාතික කතුවරයෙක් වූ මාක් ට්වේන්, වරක් මෙසේ පවසා ඇත: "හොඳ ප්‍රශංසාවක් මත මට මාස දෙකක් ජීවත් විය හැකිය." දිරි ගැන්වීමේ වචන හෝ ක්‍රියා කිසිසේත් අමතක නොවනු ඇත. තොටිල්ලේ පටන් සොහොන දක්වාම අපි දිරි ගැන්වීමට ආශා වනවා පමණක් නොව, ඒ කෙරෙහි පිපාසා ඇත්තෙමු. දිරි ගැන්වීම අපට ඉතා ලෙහෙසියෙන් ලබා දිය හැකි ත්‍යාගයක් වුවද, එය පුරුද්දක් හැටියට බෙදා ගන්නේ ඉතා ස්වල්ප දෙනෙක් වීම කණගාටුවට කරුණකි. බොහෝ දෙනෙක් සිතා සිටින පරිදි, දිරි ගැන්වීම අපගේ දිවි ගමනට ආදේශ කරගත හැකි අමතර දෙයක් නොව; එය අපගේ පැවැත්මට අත්‍යවශ්‍ය දෙයකි. මෙය වැඩිපුර දක්නට ලැබෙන තැනක් වේද, එතැන සිටින පුද්ගලයන් සහ සමාජය තුළ සවිමත් සහ සුව සම්පන්න වර්ධනයක් දක්නට ලැබෙනු නොඅනුමානය.

පළමු කිතුනු පරම්පරාව යුදයෙන් අවතැන්වූ විට, සමහරෙක් සැතපුම් 100ක් පමණ උතුරු දිශාවේ පිහිටි අන්තියෝකිය දක්වා ගමන් කළෝය. උද්යෝගිමත් එවැන්ජලිස්තවරුන් වූ ඔවුහු, හමු වන හැම කෙනා සමගම, අන්‍යජාතීන් සමගත් (මුල් වරට), ශුභාරංචිය බෙදා ගත්හ. අන්‍යජාතීන් "බොහෝ දෙනෙක්" ස්වාමීන් වහන්සේ වෙතට හැරුනු බව ලූක් තුමා වාර්තා කරයි. මෙය අන්තියෝකියේ ධර්මදානී සභාවේ කතන්දරයට ඇතුළත් වූ, පළමුවෙනි සභා වර්ධන රැල්ල ලෙස මම සලකමි (ක්‍රියා 11:19-21).

එහෙත්, දෙවෙනි රැල්ලක්ද විය. මේ සඳහා සභාවට දෙවෙනි ප්‍රගමනයකට මුල පුරන්නට සිදුවිය. අන්‍යජාතීන් විශාල සංඛ්‍යාවක් ඇද්හිල්ලට හැරී ඇති බව, යෙරුසලමේ අපෝස්තුලුවරුන්ට දැන ගන්නට ලැබුණු විට, ඔවුන් අතිශයින් වැදගත් තීරණයක් ගත යුතු බව ඔවුනට වැටහුණි.

වැඩිදුර කියවන්න

පාඨමාලා විස්තර සටහන 2025

## ශ්‍රී ලාංකික කිතුනුවෙකුගේ අනන්‍යතාව




2025 පාඨමාලා විස්තර සටහනෙහි කවරයේ චිත්‍රය ශ්‍රී ලාංකික කිතුනුවෙකුගේ ඇඟිලි සලකුණ සංකේතාත්මකව නිරූපණය කරයි. කඳු වැටි සහ නිම්න සෑදී ඇත්තේ මැද ශ්‍රී ලංකාවේ දළ සටහන සහිතව ක්‍රිස්තු ආකාර වීමට අපට ආරාධනා කරන බයිබල් පදවලින්ය. පසුබිම ජාතික ධජයේ වර්ණ දක්වයි. CTS අධ්‍යාපනයක් සිසුන්ගේ සාකල්‍ය හැඩගැස්ම මනසේ තබාගෙන නිර්මාණය කර ඇති අතර එය ශ්‍රී ලාංකේය සංස්කෘතියේ පොහොසත් උරුමය තුළ හිස, හදවත සහ අත් පරිවර්තනය කරයි. කවරයේ චිත්‍රය ශ්‍රී ලාංකික කිතුනුවන් ලෙස අපගේ අද්විතීය දෙවියන් වහන්සේ විසින් දෙන ලද අනන්‍යතාවයේ පූර්ණත්වයට වර්ධනය වීමට කරන ආරාධනාවකි.

Click Here ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ පාඨමාලා විස්තර සටහන සඳහා මෙම සබැඳිය ක්ලික් කරන්න.

# නැගෙනහිර ප්‍රාදේශීය අධ්‍යයන වැඩසටහනේ 10 වන සංවත්සරය

මඩකළපුව, ඔක්තෝම්බර් 2024: නැගෙනහිර පළාතේ ක්‍රිස්තු ආකාර නායකයන් බිහි කිරීමේ වසර 10 සැමරීම වෙනුවෙන් සිසුහු, කාර්ය මණ්ඩලය, ගුරු මණ්ඩලය සහ ප්‍රදේශයේ දේවගැතිවරු විශේෂ දේව මෙහෙයක් සහ සහභාගිත්වයක් සඳහා එක්රැස් වූහ. මෙය ප්‍රදේශයේ සභා නායකයන්ට CTSහි සේවය සහ නැගෙනහිර පළාතේ සභාව ශක්තිමත් කිරීම සඳහා හවුල් විය හැකි ආකාරය පිළිබඳව දැනගැනීමට අවස්ථාව ලබා දුන්නේය.


පළාත් අධ්‍යයන කළමනාකරු, රාජරාම් හරිහරන්


නැගෙනහිර පළාත් වැඩසටහන් සම්බන්ධීකාරක, අරුල්මේරි ජේකබ්



ගීතයෙන් ප්‍රශංසා කිරීමේ සහ ස්තුති කිරීමේ කාලයක් මෙහෙයවන සිසුන්






CTSහි අධ්‍යාපනය ඔවුන්ගේ ජීවිතය සහ දේවසේවය පරිවර්තනය කර ඇති ආකාරය පිළිබඳව සිසුහු ප්‍රබල සාක්ෂි බෙදා ගත්හ



මඩකළපුව අධ්‍යයන මධ්‍යස්ථානයේ සිසුන්, කාර්ය මණ්ඩලය සහ ගුරු මණ්ඩලය සමඟ

## විශ්වාසවන්ත සේවයේ සන්ධිස්ථාන සනිටුහන් කිරීම

## CTS ප්‍රකාශන


මහාචාර්ය පී. පී. වී. සෝමරත්න




දේවධර්ම අධ්‍යයනයන්ට සහය වීම සඳහා සන්දර්භීයව අදාළ සම්පත් සංවර්ධනය කිරීමේ පැන නගින හදිසි අවශ්‍යතාවේ හැඟීමෙන් CTS ප්‍රකාශන වර්ධනය විය. මෙම දර්ශනයේ පළමු ඵල 2001 දී මහාචාර්ය පී. පී. වී. සෝමරත්නයන්ගේ සිංහල දේවවේදී අකාරාදිය ප්‍රකාශයට පත් කිරීමත් සමග දක්නට ලැබුණි.

අද වන විට CTS ප්‍රකාශන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් මාතෘකා 140කට අධික සංඛ්‍යාවක් ඇති අතර දේවධර්මීය විශ්වකෝෂ සහ විවරණ, ඉතිහාසය, දේශනා කිරීම, ඉගැන්වීම සහ නමස්කාර-සංගීතය යන සම්පත් දක්වා විහිදෙන මුල් කෘති සහ පරිවර්තන පොත්පත් අඛණ්ඩව නිෂ්පාදනය කරමින් පවති.

අද වන විට CTS ප්‍රකාශන, එහි අලංකාර පොත් සාප්පුවෙන්, ප්‍රමුඛ පෙළේ පොත් සාප්පුවලින් සහ මාර්ගගත වේදිකා මාර්ගයෙන් ලබා ගත හැකිය.




**30 වසරක ගමනේ සන්ධිස්ථාන**





## CTS වසර අවසාන උත්සවය

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සිසුන්, ගුරු මණ්ඩලය සහ කාර්ය මණ්ඩලය ඔවුන්ගේ පවුල් සහ මිතුරන් සමග ආහාර, සංගීතය සහ සහභාගීකමින් පිරුණු විනෝදජනක සන්ධ්‍යාවක් සඳහා 2024 දෙසැම්බර් 6 වන දින එක්විය. සිසුන් විසින් මෙහෙයවන ලද සංගීත කණ්ඩායමක්, කාර්ය මණ්ඩලයේ සහ ගුරු මණ්ඩලයේ ආරාධිත රංගන සමග සන්ධ්‍යාව සඳහා ප්‍රීතිමත් මනෝභාවයක් සකස් කළේය. සිසුන් විසින් සංවිධානය කරන ලද මෙම උත්සවය 30 වන සංවත්සරය සැමරුම් ප්‍රීතිමත් අවසානයකට ගෙන ආවේය.







## CTS ලෝක දූත මෙහෙවර උදෙසා යාච්ඤා සතිය

වාර්ෂික ලෝක දූත මෙහෙවර උදෙසා යාච්ඤා සතිය 2024 නොවැම්බර් මාසයේදී පවත්වන ලද අතර ශ්‍රී ලංකාව සහ ඉන් ඔබ්බට ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රේෂ්ඨ ආඥාව ඉටු කරන අතරතුර යාච්ඤාව අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ප්‍රජාව තුළ නැවුම් උද්යෝගයක් ඇති කළේය. අවධානය යොමු වූයේ ශ්‍රී ලංකාව, CTS, ශ්‍රී ලාංකේය සභාව සහ ලෝකය වෙනුවෙන් යාච්ඤා කිරීම කෙරෙහිය.








## අජිත් ප්‍රනාන්දු සමග සුහද හමුව

2024 ඔක්තෝබර් මාසයේදී, ජීවිතය සහ දේව සේවය පිළිබඳව අජිත් ප්‍රනාන්දු සමග මුහුණට මුහුණ සංවාදයක යෙදීමේ ප්‍රීතිමත් වරප්‍රසාදය සිසුන්ට හිමිවිය.

ජ්‍යෙෂ්ඨ සහ පළපුරුදු ක්‍රිස්තියානි නායකයන් මුණගැසීමේ අවස්ථාව කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි අධ්‍යාත්මික හැඩගැසීමේ වැඩසටහනේ කොටසක් ලෙස ක්‍රියාමක වන මුලපිරීම්වලින් එකකි.

විශේෂ සම්මන්ත්‍රණය

## "ළමුන් සහ යෞවන යෞවනියන් සඳහා චිත්තවේගීය යහපැවැත්ම"

ළමුන්ගේ සහ යෞවන යෞවනියනගේ චිත්තවේගීය යහපැවැත්ම සැලකිල්ලට ලක් කරමින් දෙමළ මාධ්‍යයෙන් විශේෂ සම්මන්ත්‍රණයක් පැවැත්විණි. මෙය මෙහෙයවනු ලැබුවේ පළපුරුදු ළමා හා යොවුන් වියේ පසුවන්නන් සහා චිකිත්සකවරියක සහ උපදේශිකාවක වන නිවේදිතා ජීවබාලන් විසිනි. මෙම සම්මන්ත්‍රණය 2025 නොවැම්බර් මාසයේ CTS උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.







## ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය
## "මේ යුගයේ දෙවියා" කවුද?

2024 නොවැම්බර් මාසයේදී ශාස්ත්‍රීය සම්මන්ත්‍රණයක් පවත්වන ලද අතර, එහිදී ආචාර්ය අයිවෝ පූබාලන් විසින් 2 කොරින්ති 4:4 හි සඳහන් 'මේ යුගයේ දෙවියා' යන පාවුලුතුමාගේ යෙදුමේ අර්ථය නැවත පරීක්ෂා කිරීම උදෙසා තර්ක කරන ඔහුගේ ආචාර්ය උපාධි නිබන්ධනය සඳහා ඔහුගේ පර්යේෂණ කරුණු ඉදිරිපත් කරන ලදී.

විවිධ නිකායන් සහ සංවිධානවල නායකයෝ සහ බයිබල් පරිවර්තන කමිටුවේ නියෝජිතයෝ මෙම අවස්ථාවට සහභාගී වූහ. පැමිණ සිටි අය සිත්ගන්නාසුලු සාකච්ඡාවක නිරත වූහ. දේවගැති සයිමන් ෆුලර්ගේ (හිටපු විදුහල්පති, CTS) විධිමත් ප්‍රතිචාරයකින් කටයුතු අවසන් විය.








සුබ පැතුම්

## දේවගැති රොමේෂ් බුලත්සිංහල, MD, ශ්‍රී ලංකාවේ සිව්චතුරස්‍ර ශුභාරංචි දේවස්ථානයේ සභාපති ලෙස පත් කරනු ලැබ ඇත

CTS කවුන්සිලයේ උප සභාපති ධුරය දරන දේවගැති රොමේෂ් බුලත්සිංහල, MD, ශ්‍රී ලංකාවේ සිව්චතුරස්‍ර ශුභාරංචි දේවස්ථානයේ සභාපති ලෙස, ලෙස්ලි කීගල් (CTS ආරම්භක සාමාජිකයකු වේ) දේවගැතිතුමාගෙන් පසුව තේරී පත්ව ඇත. නව කාර්යභාරයේ වගකීම් බාර ගන්නා අතර සභාපාලක රොමේෂ් යාච්ඤාවෙන් ඔසවන්න.

## සිහි කිරීමයි | වැඩිහිටි යූ සුන් ආන්

CTS හි වසර 30 ක සේවා කාලයෙන් වැඩි කාලයක් එහි ස්ථිර මිතුරෙකු වූ වැඩිහිටි යූ සුන් ආන් ජනවාරි මැද භාගයේදී අභාවප්‍රාප්ත විය. ඔහු දකුණු කොරියානු ඇදහිලිවන්තයන් පිරිසකට නායකත්වය දුන් අතර, ඔවුහු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි නව ශාස්ත්‍රාලයට යාච්ඤාවෙන් සහ පරිත්‍යාගයෙන් සහය වීමට කැපවී සිටියහ. 'කොරියාවේ සහය මෙහෙවරේ' (KSM) සහයෝගය සෑම අසීරු අවස්ථාවලම අඛණ්ඩව පැවතුනි. පසුගිය වසරේ සියොල් හි (වම සිට දකුණට) ගෞරවනීය ක්වොන් දේවගැතිතුමා, පෝල් ෂින් සහ වැඩිහිටි ආන් සමඟ සහභාගිත්වයේ කාලයක් ගත කිරීමට ලැබීම CTS විදුහල්පති අයිවෝ පූබාලන්ට විශේෂ සතුටක් විය. වැඩිහිටි ආන් වෙනුවෙන් අපි ස්වාමීන්වහන්සේට ස්තූතිවන්ත වන අතර, මෙම ශෝකජනක කාලය තුළ ඔහුගේ පවුලේ අය සහ මිතුරන් වෙනුවෙන් යාච්ඤා කරමු.



### කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය වෙත දීම

**1 බැංකු ප්‍රේෂණ සහ විදේශ මුදල් යැවීම (ඇ.ඩො. සහ කැ.ඩො)**

වැඩි විස්තර සඳහා අප අමතන්න

**2 ණයවර පත (ක්‍රෙඩිට් කාඩ්)**

**CTS වෙබ් අඩවිය හරහා ගෙවීම් කරන්නට**

WWW.CTS.LK වෙත පිවිසෙන්න
|
පිටුවේ ඉහළ දකුණේ තිබෙන 'GIVE TO CTS' බොත්තම ඔබන්න
|
පරිත්‍යාග කරන්න

**3 චෙක්පත්**

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ **නමට ලියන්න** (ගෙවීම් ලබන්නා) විදුහල්පති, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය, 189, දුටුගැමුණු වීදිය, කොහුවල, ශ්‍රී ලංකාව **වෙත එවන්න**

**4 මුදල් ගෙවීම්**

කොහුවල කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය මූලස්ථානය වෙත පිවිසෙන්න

වැඩි විස්තර සඳහා සම්පත් සංවර්ධන කළමනාකාර, රොෂෙල් හේකල්-රණසිංහ අමතන්න
+94 77 350 2930 | rochelle@cts.lk